# කොහොමද මචං?

# උගන්නනවා මචං



නලීන් මාපිටියගේ යොමු කිරීමෙන් 'රෝමය ගිනි ගනී' නාට්‍යයට සාරේ ගුරු ලෙස සම්බන්ධ වන ධර්මප්‍රිය ඩයස් ගේ කලා ජීවිතයට එතැන් පටන් ලැබෙන්නේ දැවැන්ත රැකෂයන්ගේ සෙවණය. ජයලත් මනෝරත්න, කේ. බී. හේරත්, රාජිත දිසානායක, තුමිඳු දොඩංතැන්න, චාමික හත්ලහවත්ත වැනි පරම්පරා කිහිපයක විශිෂ්ඨයන් අත්වැල් කොට නැගෙන ඩයස්, ප්‍රසන්න විතානගේ ගේ 'හොරු සමග හෙළුවෙන්' ඉක්බිතිව ඔහු සම්බන්ධීකරණය කරන මචං චිත්‍රපටයෙන් ලොව පුරා ආකර්ශණීය රංගන ශිල්පියෙකු බවට පත්වන්නේය. දැන් ඒ මචං උගන්වන්නේ ය. ඒ චිත්‍රපටයක නොවේය. ඔහුගේ වෘත්තීය ගුරුකම වී ඇත. අපි ඒ ගුරුවරයා හමුවන්නට ඔහු උගන්වන දෙහිවල ශාස්ත්‍රානන්දයට ගොඩ වුණෙමු.

ඉස්සර වෙසක් එකට කැස්බෑව හන්දියෙ හරි වැව මැද්දේ හරි නාට්‍යය පෙන්වනවා. ඒවායේ කුමාරයා සමහර විට නගර සභාවේ කුනු ට්‍රැක්ටරේ ඩ්‍රයිවර්. ඒ වගේ රජ වෙන්නෙත් දන්න කියන උදේ හවස හම්බවෙන බයිසිකලෙන් ගමන් යන කෙනෙක්.

ධර්මප්‍රිය ඩයස් ට නළු ආසාව ඇතිවන්නේ මේ අපූරු සිදුවීම් සමගින් ය. ඒ නිසා පුංචි කාලේ සිටම ඩයස්ගේ හිතේ නළුවෙකුවීමේ උවමනාව තිබුණේය. කොළමුන්න ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලයේ සමිති සමාගම් ද දහම් පාසල් උත්සව මෙන්ම මුතුහර රූපවාහිනී ළමා සමාජ උත්සවද ඩයස්ගේ රංගන පිපාසාවට අපූරු දිය උල්පත් වූවේය.

වැඩේ හරි පිල්ලට වැටෙන්නෙ ඒ ලෙවල් කරන්න පිළියන්දල සෙන්ට්‍රල් එකට ආවාම.

හමුවන මිතුරු කැල මෙන්ම ප්‍රේමකුමාර කරුණාරත්න නම් අපූරු ගුරුවරයා ද නොවන්නට ධර්මප්‍රිය ඩයස් නම් සුවිශේෂී රංගන ශිල්පියෙකු නොසිටින්නට ඉඩ තිබිණි.

එහෙනම් ඉතිං පාරවල් අයිනෙ බෝක්කු උඩ රගපාන මැරයියෙක් වෙන්නත් තිබුණා.

ඒ ඇසුරේ වටිනාකම තවදුරටත් ඒත්තු ගන්වනු රිසියෙන් ඩයස් උදාහරණ සපයන්නේය.

නාට්‍යකරණයට තියෙන්න ඕනෙ වගකීම සංයමය ගැන හැගීමක් මට ඇති කරේ ප්‍රේමකුමාර සර්.

ඊට අමතරව අදත් විවිධාකාරයෙන් කලාවට බැඳී සිටින ඉන්ද්‍රප්‍රිය උදිත කුමාර, කාවින්ද සුරේන්, ඉන්ද්‍රජිත් චාමිකර, තිලංග සමන් කුමාර, නලින් කලගල. සුමින්ද නාමල් වැනි විශාල මිතුරු කැළ තමාගේ ජීවිතයට ශක්තියක් වූ බව ඩයස් පවසන්නේ අප්‍රමාණ වූ සෙනෙහසිනි.

අපිට තිබුණෙ එක එක ටැලන්ට්. අපි ඒවා එකට මුහුකරගෙන වැඩ කරා. එතෙන්දි සොරොව්ව වුණේ ප්‍රේමකුමාර් සර්. එතනින් වැඩියෙන් යන්න දුන්නෙත් නෑ. අඩුවෙන් යන්න දුන්නෙත් නෑ.

එසේම එකිනෙකා අතර තිබුණු විවේචන නිසා නිර්මාණයකදී විශාල වගයෙන් පරිස්සම් වීමට සියල්ලෝම උත්සුක වූ බව පවසන ඩයස් ඒ නිසා අලුත් බව නිරන්තරයෙන්ම තම මිතුරු සමාගමේ නිර්මාණවලට හැම අතින්ම ලැබුණු බවද පෙන්වා දෙයි.

සර් තියරි උගන්නන්න ඉස්සෙල්ලා අපට ප්‍රැක්ටිකල් කරේ. අපි නාට්‍යයක් කරන හැටි ඉගෙනගෙන තමයි පොත ඇල්ලුවෙ.

එහි ගෞරවයද ඩයස් පවරන්නේ ප්‍රේමකුමාරයන්ටය. පොතට සීමා නොවුණු ඒ ප්‍රායෝගික මිනිසා නිරන්තරයෙන් වැඩ මුළු පවත්වමින් ඔහු සලමන් ෆොන්සේකා වැනි විද්වතුන්ගෙන් නොලා ගත් දැනුමද නොමසුරුව තමන්ට බෙදාදුන් බව ඩයස් පවසන්නේය.

රස්සාවක් කරන් නැද්ද කියල ඇහුවම මම තවම කැම්පස් කියන උත්තරේ මට තිබුණා. ඒ නිසා රස්තියාදුකාරයෙක් විදිහට කවුරුවත් මං දිහා බැලුවෙ නැහැ.

රැකියා නැතිව වේදිකා ගානේ රස්තියාදු වීමේදී රස්සාවක් නොකර සිටීම ගැන එල්ල වන චෝදනා වලින් ගැලවෙන්න විශ්ව විද්‍යාලයේ සිටීම ගැන ඩයස්ට ලැබෙන සැහැල්ලුව විශාල දෙයක් කොට ඔහු සිතන්නේය.

මං අවිධිමත්ව ඉගෙන ගත්තු දේ වැඩියි. ඒත් විධිමත් විදියට ලැබුණු දැණුම මා තුළ සංයමයක් නිර්මාණය කරලා තියෙනවා.

ඩයස් ඇතැම් සිදුවීම් වලට වර්තමානයේ මුහුණ දෙන උපේක්ෂා සහගත බව ඒ සංයමයෙන් උකහාගත් බව පවසයි.

ඉස්සර නම් දෙකක් අනිනවා.

ඔහු ඒ වෙනස තව දුරටත් පැහැදිලි කරයි. ඒ වෙනස්වීම මෙන්ම ඔහු ගුරුවරයකු වී තිබෙ, වර්තමානයේ දී ගුරුවරයාගේ ආකෘතිය වෙනස් කළ හැකි ඉඩකඩ ද සොයමින් සිටියි.

මං තවම ගුරු උපදෙස් කියවනවා. ඒකේ දී ඇති පිළිවෙලට වැඩ කිරීමට සම්පත් සොයාගත නොහැකි නම් වෙනස් ආකාරයකට කටයුතු කිරීමට ඉඩ තියෙනවා. මම එක දක්කම ගොඩක් සතුටු වුණා.

ඔහු ගුරුවරයෙක් වී ඇති දෙහිවල ශාස්ත්‍රානන්ද විද්‍යාලයේ විදුහල්පති පතිරණ මහතා මෙන්ම සහෝදර ගුරුවර ගුරුවරියෝ ද නළුවෙකු ලෙස නොව තමා අලුත් ගුරවරයකු ලෙස බාරගෙන තිබීම පිළිබඳව ඩයස්ට ඇත්තේ සැහැල්ලුවක්.

ළමයි නළුවෙක් විදිහට සළකන්නේ මං නළුවෙක් විදියට ඉන්න ගියොත්. මං ගුරුවරයා විදිහට හිටියම ඒකේ ප්‍රශ්නයක් නැහැ.

එහෙත් තමාට නළුවෙකු ලෙස ආදරය කරන සිසු සිසුවියන් එය හදවතේ තබාගෙන තමාට ගරුකරන බව ඩයස්ට දැනී ඇත. එසේම නළුවෙකු ලෙස සියලු ආගම් ජාතිවලට අයත් සිසු සිසුවියන් ඉගෙන ගන්නා ශාස්ත්‍රානන්දය තමාට විශාල සම්පතක් බවද ඩයස් විශ්වාස කරන්නේය.

ඒ වගේම මටත් මේ ළමයින්ට දෙන්න දෙයක් තියෙනවා.

ඔහු සිය දැනුමෙන් සාමාන්‍ය පෙළ විභාගයේ දීඝහළ ප්‍රතිඵල ලබා දෙන්නටත් උසස් පෙළ චිත්‍ර විෂයෙන් සිසුවෙකු විශ්ව විද්‍යාලයට දක්වා ගෙන යාමටත් සිහින දකින්නේය.

මරු ඇක්ටර්ස්ල ඉන්නවා මං ප්‍රින්සිපල් සර්ටත් කිව්වා.

වරදක් කර එය නොකළ සිටින සේ සූක්ෂම ලෙස දරුවන් කිහිපදෙනෙකු ගැන ඩයස් පවසන්නේ එලෙසින් ය.

මං පිටපතක් ලියනවා. මේ ළමයින්ගෙ දක්ෂකම වේදිකාවට ගේන්න ඕනි.

ඩයස් නම් ගුරුවරයාට ශාස්ත්‍රානන්දයේ දරු දැරියෝ ගැන තවත් බලාපොරොත්තුවක් ඇත.

රංගනය කියන්නෙ සූක්ෂම දෙයක්

සිය නළුකමක් ගුරුකමත් පටලවා නොගෙන චරිතවලට ඇති අනන්‍යතාවය සුරක්ෂිත කරගෙන කටයුතු කිරීමට ඒ සූක්ෂම හැසිරීම පිළිබඳව තමා සතු ප්‍රායෝගික කුසලතාවයන් ප්‍රයෝජනවත් බව ඩයස් පවසන්නේය.

ලෝකයේ බුහුමනට පත්විය හැකි අන්දමේ රංගනයන් විදහා දක්වන ධර්මප්‍රිය ඩයස්ගේ ගුරුකම ද රටට ලෝකයටම වැඩ ඇති පුරවැසියන් තනන නිමැවුම් හලක් වේවා යන්න 'තිසර' පැතුමය.

නිශ්මං රණසිංහ

ඡායාරූප: ජයසිරි වික්‍රමසිංහ



ගුරුපත්වීම ලැබූ ශාන්ත්‍රානන්දයේ සේවය කරමින්...